**නිවිතිගල ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**-------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූනි 30 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නිවිතිගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබී තිබූ මුද්දර ගාස්තු රු. 13,063,561 ක් හා උසාවි දඩ රු. 44,197 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉකුත් වර්ෂවලට අදාල ආදායම් සමුච්චිත අරමුදල මඟින් ගැලපීම් කළ යුතුවේ. | නිවැරදි කර ගිණුම්ගත කරන බව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු මූලධන ආධාර රු. 299,619 ක් සමුච්චිත අරමුදලට බැර කර තිබුණි. | වර්ෂයට අදාල සියළු ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයට අදාල දේශීය ණය සංවර්ධන අරමුදල් ගිණුමේ ණය වාරික රු. 347,553 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල වියදම් හා ණය ආපසු ගෙවීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | 2019 වර්ෂයට ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. | වර්ෂයට අදාල ගෙවිය යුතු වියදම් සඳහා වෙන්කිරීම් කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඉ) | ගිණුම් විෂයයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 8,991,162 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ ඊට අදාල උපයෝගී ලේඛන සමඟ සැසඳිය යුතුවේ. | අදාල වෙනස්කම් පරීක්ෂා කර බලා නිවැරදි කරන බව දන්වමි. |

## 1.4 අනුකූල නොවීම

--------------------

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | කල්ඉකුත් වූ එකතුව රු. 1,359,445 ක් වූ මිශ්‍ර තැන්පත්, ටෙන්ඩර් තැන්පත්, ගිවිසුම් හා කර්මාන්ත ඇප තැන්පතු හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | | |
| | (i) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 07 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | අළුත්වැඩියා කටයුතු අප්‍රමාදව සිදුකිරීමටත්, චක්‍රලේඛ ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදුකිරීමටත් කටයුතු කළ යුතුවේ. | මීටර් ක්‍රියාකාරීව පවතින වාහන වල ඉන්ධන පරීක්ෂාව නිසි පරිදි සිදුකර ඇති බවත්, මීටර් අක්‍රීයව පැවති වාහනවල මීටර් සවිකර ඉන්ධන පරීක්ෂා සිදුකිරීම ආරම්භ කර ඇති බවත් දන්වමි. |
| | (ii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂිකව අත්සන් කලයුතු කාර්යයසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා කාර්යයසාධන ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | 2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය | ආයතනික කාර්යයභාරයේ නිමවුමට අදාල නිමවුම් දර්ශක හා ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල දර්ශක හඳුනාගත යුතුවේ. | 2020 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරන බව දන්වමි. |
| (ඈ) | 2018 ජූලි 19 දිනැති අංක 2018/ඉ-පළාත් පාලන 01 දරන පළාත් පාලන චක්‍රලේඛය | සේවාලාභියාට අන්තර්ජාලය හරහා සේවාවන් අයදුම් කිරීමේ අවස්ථාව සලසාදීම සඳහා අවශ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට සභාව අපොහොසත්ව තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර සේවාලාභීන්ට පහසුකම් සැලසිය යුතුවේ. | පවතින අන්තර්ජාල පහසුකම් සේවාවන් සැපයීම වෙනුවෙන් වැඩිදියුණු කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 12,283,655 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,855,332 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,489,013 | 3,269,533 | 3,381,423 | 1,214,652 | 3,168,296 | 3,279,385 | 3,384,786 | 1,340,102 |
| කුලී | 8,637,500 | 6,407,890 | 6,437,990 | 60,850 | 4,399,800 | 5,553,416 | 5,568,416 | 90,950 |
| බලපත්‍ර ගාස්තු | 844,250 | 605,874 | 605,874 | 1,500 | 538,300 | 479,696 | 483,196 | 1,500 |
| වෙනත් ආදායම් | 16,628,975 | 27,469,093 | 33,204,463 | 9,577,545 | 12,396,250 | 18,427,938 | 17,026,489 | 15,433,247 |
| | 29,599,738 | 37,752,390 | 43,629,750 | 10,854,547 | 20,502,646 | 27,740,435 | 26,462,887 | 16,865,799 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) වරිපනම්** | | |
| (i) සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 996,275 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුල වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන වරිපනම් ඒකක 146 කට අදාල රු. 334,888 ක් ඇතුලත් වී තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය තුල දේපල තහනම් කිරීමේ වැඩසටහන් මඟින් හිඟ ආදායම් රැස්කල බවත්, තවදුරටත් පවතින හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ii) වරිපනම් බදු අයකිරීම සඳහා සභා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වසර 05 කට වරක් තක්සේරු කලයුතු වුවද, 2011 වර්ෂයෙන් පසු දේපල තක්සේරු කර නොතිබුණි. | වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතුවේ. | දේපල තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා යැවූවද මේ දක්වා එම කාර්යය ඉටුකර දී නොමැති බව දන්වමි. |

**(ආ) අක්කර බදු**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු. 91,115 ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුල ඒකක 73 කින් අයවිය යුතු වසර 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන රු. 65,743 ක් ඇතුලත් වී තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අක්කර බදු සතොයක්ෂණය සිදු කර ඇති බවත්, හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ උසාවි දඩ රු. 1,558,583 ක් හා මුද්දර ගාස්තු රු. 9,438,835 ක් විය. 2019 ජූලි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව අයවිය යුතු මුද්දර ගාස්තු 2020 මාර්තු වනවිටත් හඳුනාගෙන නොතිබුණි. | සභාව වෙත අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 ජූලි මස සිට දෙසැම්බර් දක්වා කාලයට අදාල මුද්දර ගාස්තු උප ලේඛන ලැබී නොමැති බව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මානව සම්පත් කළමනාකරණය**

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු සඳහා විධිමත් අනුමැතියකින් තොරව සේවකයින් 08 දෙනෙකු බඳවාගෙන 2017 වර්ෂයේ සිට 2019 ඔක්තෝබර් දක්වා කාලය සඳහා වැටුප් හා දීමනා වශයෙන් රු. 3,454,772 ක් ගෙවා තිබුණි. | සේවක බඳවාගැනීම් විධිමත්ව සිදුකළ යුතුවේ. | 2017 ඇති වූ හදිසි ආපදා තත්ත්වය මත බල ප්‍රදේශයේ එක්රැස්වූ කසළ එකතු කිරීම හා අවසන් බැහැරලීම සිදු කිරීමට කම්කරුවන් ප්‍රමාණවත් නොවීම නිසා සේවය අඛණ්ඩව කර ගෙන යාමට දෛනික පදනම මත සේවය ලබා ගෙන ඇති බවත්, මේ වනවිට ඔවුන් බඳවා ගැනීමට සභාව තීරණය කර ඇති බවත් දන්වමි. |
| (ආ) | ස්ථිර රියදුරු තනතුරුවල පැවති පුරප්පාඩු 03 ක් සඳහා අනියම් රියදුරන් තිදෙනෙකු සේවා ගිවිසුම් මත බඳවාගෙන තිබුණි. එහෙත් එම රියදුරන්, බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා නොතිබුණි. | සේවක බඳවාගැනීම්, අදාල බඳවාගැනීමේ පටිපාටියට අනුකූලව සිදුකළ යුතුවේ. | මෙම සේවකයින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධීක්ෂණය හා මඟ පෙන්වීම මත දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් පවත් වන විධිමත් සහතිකයක් සහිත දින 10 ක පුහුණු පාඨමාලාවට යොමු කිරීමට ඉල්ලීම් සිදුකර ඇති බව දන්වමි. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල හඳුනාගෙන තිබූ අනවසර ඉදිකිරීම් 08 ක් ඉවත්කිරීමට හෝ නියමානුකූල කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් විධිමත්ව කටයුතු කළ යුතුවේ. | කාර්මික නිලධාරී පරීක්ෂාවෙන් පසු ලිඛිත දැනුම්දීම් සිදුකර ඇති බව දන්වමි. |

## 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු. 149,950,452 ක් වූ ජංගම නොවන වත්කම් සභාව සතුව පැවතියද වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. | වත්කම් ලේඛන යාවත්කාලීනව නඩත්තු කළ යුතුවේ. | සභාව සතු වාහන සියල්ලම ලේඛනගත කර ඇති බවත්, යන්ත්‍ර හා උපකරණ, ලී බඩු හා සවිකිරීම් ලේඛනගත කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |

### 3.3.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු ගර්හිත වාහන 02 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ගර්හිත වාහන අපහරණය කළ යුතුවේ. | අදාල වාහන 2019 දෙසැම්බර් 27 දින වෙන්දේසි කල නමුත් ගැනුම්කරුවෙකු ඉදිරිපත් නොවූ අතර, නව තක්සේරුව අනුව ඉදිරියේදී නැවත වෙන්දේසි කිරීමට නියමිත බවත් දන්වමි. |

### 3.3.3 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 09 ක් සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව පරිහරණය කරන වත්කම් විධිමත් පරිදි පවරා ගත යුතුවේ. | අදාල වාහන සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

**3.4** **අවිධිමත් ගනුදෙනු**

**----------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනත හෝ වෙනත් චක්‍රලේඛ මගින් හෝ මහජන නියෝජිතයින් වෙත ණය අත්තිකාරම් ලබාදීම සඳහා බලයක් ලබාදී නොතිබියදී මහජන නියෝජිතයින් 14 ක් වෙත උත්සව අත්තිකාරම් වශයෙන් රු. 350,000 ක් 2019 අප්‍රේල් මස ගෙවා තිබුණි. | මහජන නියෝජිතයින්ට ණය අත්තිකාරම් ලබාදීම සඳහා ලිඛිත නීතියක් යටතේ ප්‍රතිපාදන සලසා දී නොමැත. | 2019 අප්‍රේල් 09 දින මාසික සභා රැස්වීම් අංක 05:07:iii දරන තීරණයට අනුව මෙම ණය මුදල් ගෙවා ඇති බව දන්වමි. |

**3.5** **ප්‍රසම්පාදනය**

**---------------**

**සැපයීම් හා සේවා**

**------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.7.7 හා 2.8.5 වගන්තිවල විධිවිධානයන්ට පටහැනිව ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතියකින් තොරව රු. 230,000 ක් වැයකර සභාව සතු කැබ් රථයකට කැනපියක් සවිකර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරන බව දන්වමි. |